# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2391/05 – 2024 ජූලි මස 01 වැනි සඳුදා – 2024.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2022/30

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඒ. එස්. ඩබ්. බන්දුසිරි සිල්වා මයා, "ලලිත් සිරි", ගාලු පාර, කුඩා වස්කඩුව, වස්කඩුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කලල්ගොඩ පාර, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, අංක 15, කැප්ටන් එම්. ජී. ජී. මෙන්ඩිස් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනුෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

1A – G 042142 – 16 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2022/30

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එස්. ඩබ්. බන්දුසිරි සිල්වා මයා, "ලලිත් සිරි", ගාලු පාර, කුඩා වස්කඩුව, වස්කඩුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවය කරන ඒ.එස්.ඩබ්. බන්දුසිරි සිල්වා මහතාට උසස්වීම් හිමිද, හිමි නම් උසස් වීම් ලබා නොදීම හා එයට අදළ වැටුප් තලවල නොපිහිටුවීම මඟින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු තනතුර, සහන කවරේ ද, කවදා සිට කොපමණ ප්‍රමාණයක් ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0005

---

මගේ අංකය: IR/COM/02/2023/186

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ප්‍රසාද් ධනංජය මහකුමාර මයා, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, නො. 60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
නිරාශා ගයා නි රත්නවීර මිය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, නො. 60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, නො. 60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිලියන්දල, බුද්ධාලෝක පාර, නො.40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/02/2023/186

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ප්‍රසාද් ධනංජය මහකුඹුර මයා, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, නො. 60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
නිරාශා ගයානි රත්නවීර මිය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, නො. 60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, නො. 60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය..

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"බාහිර පුද්ගලයෙකු විසින් 2021 වසරේ ආයතනයේ උපකරණ යැයි පැවසෙන Automess scintillator probe නමැති විකිරණ මනිත උපකරණයක් ශ්‍රී ලංකාවෙන් බැහැරට (මාලදිවයින වෙත) ගෙනයාමක් සම්බන්ධයෙන් සිදු කළ විනය පරීක්ෂණයේ දී හා අනතුරුව ලබා දී ඇති දඬුවම මගින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශයේ විද්‍යාත්මක නිලධාරිනියක ලෙස සේවය කරන නිරාශා ගයානි රත්නවීර මියට හා එම අංශයේම අධ්‍යක්ෂක ලෙස සේවය කරන ප්‍රසාද් ධනංජය මහ කුමාර මයා හට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 - 0006

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.